## ස ම් පි ණ් ඩ න ය

සියබස්ලකර පිළිබඳ විවේචනාත්මක සංස්කරණයක් මෙහි ඇතුළත් වෙයි. මෙහි දී ප්‍රයත්න දරන ලද්දේ පුස්කොළ පිටපත් හා මුද්‍රිත ග්‍රන්ථ පාදක කොට ගෙන හැකි තාක් දුරට කතුවරයාගේ පෙළ ප්‍රතිෂ්ඨාපනය කිරීමට ය.

සියබස්ලකරෙහි මූල ග්‍රන්ථය වන දණ්ඩින්ගේ කාව්‍යාදර්ශයේ කර්තෘ, කාල, ප්‍රමාණාදිය පිළිබඳ අධ්‍යයනයක් ද සියබස්ලකරෙහි ඉදිරිපත් කෙරෙන රීති හා අලංකාර යන සාහිත්‍ය න්‍යායයන් හැදෑරීමට අවශ්‍ය වන උපකාරක කරුණු සංග්‍රහයක් ද තව දුරටත් මෙහි අන්තර් ගත කොට තිබේ.